සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

87 S I

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ........................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I කාලය : පැ. 01යි.**

උපදෙස්
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40ක් හිමි වේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( ✕ ) ලකුණ යොදන්න.

(01) සන්නිවේදන මූලිකාංගයක් වන්නේ,
(1) පෙළඹවීම. (2) අභිසාරිතාව (3) සංජානනය (4) බලපෑම

(02) විමලා සහ කමලා දුරකථනයෙන් කතා කරමින් සිටියි. මෙම අවස්ථාවේදී සිදුවන සන්නිවේදන වර්ගය වන්නේ,
(1) අන්තර් පුද්ගල සන්නිවේදනය (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(3) සමූහ සන්නිවේදනය (4) ජන සන්නිවේදනය

(03) සන්නිවේදන බාධක පිළිබඳ ආකෘතියක් මගින් මුලින් ම ඉදිරිපත් කරන ලද්දේ,
(1) හැරල්ඩ් ලැස්වෙල් විසිනි. (2) ෂැනොන් සහ වීවර් විසිනි.
(3) කර්ට් ලෙවින් විසිනි. (4) ශ්‍රාම් ඔස්ගුඩ් විසිනි.

(04) ලොව මුල් ම කඩදාසිය නිර්මාණය කරන ලද්දේ,
(1) ක්‍රි.පූ 4වන සියවසේ දීය. (2) ක්‍රි.පූ 3වන සියවසේ දීය.
(3) ක්‍රි.පූ 2වන සියවසේ දීය. (4) ක්‍රි.පූ 1වන සියවසේ දීය.

(05) ප්‍රක්ෂේපණය වන පන්ති කාමර මාධ්‍ය උපකරණයක් නොවන්නේ,
(1) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) කාන්දම් ලෑල්ල
(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය (4) අන්තර් ක්‍රියාකාරී පුවරුව

(06) ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත වන්නේ,
(1) ලංකා ලෝකය (2) කලම්බු ජර්නල් (3) ඥානාර්ථ ප්‍රදීපය (4) ලංකාදීප

(07) මාධ්‍ය ආයතනයක අභ්‍යන්තර මාධ්‍යවේදීන් හඳුන්වන්නේ,
(1) නිදහස් මාධ්‍යවේදීන් ලෙසය. (2) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ලෙසය.
(3) මාණ්ඩලික මාධ්‍යවේදීන් ලෙසය. (4) පුරවැසි මාධ්‍යවේදීන් ලෙසය.

(08) පාඩමක් අතරතුර පොතක පිටුවක් හෝ ඡායාරූපයක් හෝ ඒ අවස්ථාවේදී විශාලනය කර පෙන්වන්නට අවශ්‍ය වුවහොත් යොදා ගත හැක්කේ,
(1) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය (4) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය

(09) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියක නිමි කටයුතු සඳහා භාවිත කරන මෙවලම් ලෙස සැලකිය හැකි වන්නේ,
(1) බැඳුම් උපකරණ, ලැමිනේටින් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය, ස්ටෙප්ලර් යන්ත්‍රය
(2) ස්ටෙප්ලර් යන්ත්‍රය, ගණක යන්ත්‍රය, ලැමිනේටින් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය
(3) ලේසර් මුද්‍රණ යන්ත්‍රය, ඡායා පිටපත් යන්ත්‍රය, කැපුම් යන්ත්‍රය, ලැමිනේටින් යන්ත්‍රය
(4) ඡායාපිටපත් යන්ත්‍රය, මුද්‍රණ යන්ත්‍රය, බැඳුම් උපකරණ, ලැමිනේටින් යන්ත්‍රය

(10) පුවත්පතක අන්තර්ගතය හා ව්‍යුහය පිළිබඳව සමස්ත වගකීම දරනු ලබන්නේ,
(1) සභාපති ය. (2) ප්‍රධාන කර්තෘ ය.
(3) කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂක ය. (4) ප්‍රධාන විධායක නිලධාරීය.

(11) ශ්‍රී ලංකාවේ පුවත්පත් ඉතිහාසය තුළ ආරම්භ කරන ලද ප්‍රථම පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය ලෙස සැලකෙන්නේ,
(1) දවස පුවත්පත් සමාගම (2) විජය පුවත්පත් සමාගම
(3) ලේක් හවුස් පුවත්පත් ආයතනය (4) වීරකේසරි පුවත්පත් සමාගම

(12) ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයක් නොවන්නේ,
(1) කොළ අතු එල්ලීම (2) අඬ බෙර ගැසීම (3) හූව (4) පෝස්ටර්

(13) සන්නිවේදකයා යම් මාධ්‍යක් ඔස්සේ යවන සංදේශය ලබන පාර්ශවය හඳුන්වන්නේ,
(1) දොරටුපාල යනුවෙනි. (2) සබකෝලය යනුවෙනි.
(3) ග්‍රාහකයා යනුවෙනි. (4) ප්‍රතිපෝෂණය යනුවෙනි.

(14) 19 වන ශත වර්ෂයේ දී කම්බියක් ඔස්සේ විදුලි සංඥා යැවීමේ ක්‍රමය හඳුන්වා දෙන ලද්දේ,
(1) ඇලෙක් සැන්ඩර් ග්‍රැහැම්බෙල් විසිනි. (2) ගුග්ලිමෝ මාර්කෝනි විසිනි.
(3) එඩ්වඩ් හාපර් විසිනි. (4) සැමුවෙල් මෝස් විසිනි.

(15) ජන මාධ්‍ය හිමිකාරිත්වයේ ප්‍රභේද දෙක වන්නේ,
(1) රාජ්‍ය මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය (2) රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය
(3) පෞද්ගලික මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය (4) ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය


(16) ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන අවස්ථාවක් වන්නේ,
(1) සංදේශයේ තොරතුරු විකෘති වී තිබීම. (2) නිවැරදි තොරතුරු ගොනුකර තිබීම.
(3) ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට ගැලපීම. (4) සංදේශය තුළ පැහැදිලි අර්ථ තිබීම.

(17) ඔබ පුවත්පතක් කියවමින් සිටී. එහිදී සන්නිවේදන මූලිකාංගවල අනුපිළිවෙළ වන්නේ,
A - සංදේශය B - ග්‍රාහකයා C - සන්නිවේදකයා
(1) C, A සහ B ය. (2) C, B සහ A ය. (3) B, A සහ C ය. (4) B, C සහ A ය.

(18) මුදල් ගණින යන්ත්‍රයේ කාර්යයකි.
(1) කාසි සංඛ්‍යාව ගණනය කිරීම. (2) කාසි සහ නෝට්ටු සංඛ්‍යාව ගණනය කිරීම.
(3) මුදලේ වටිනාකම පත්‍රිකාවක මුද්‍රණය කිරීම. (4) නෝට්ටු සංඛ්‍යාව ගණනය කිරීම.

(19) උපාලි විජේවර්ධන, ඇම්.ඩී. ගුණසේන, ඩී.ආර්. විජේවර්ධන යන චරිත හඳුනාගන්නේ,
(1) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ නිවේදකයින් ලෙසය.
(2) ශ්‍රී ලංකා පුවත්පත් කර්මාන්තයේ කැපී පෙනෙන චරිත ලෙසය.
(3) ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වා දීමට පුරෝගාමීන් වුවන් ලෙසය.
(4) ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන පුවත්පත් සංස්කාරකවරුන් ලෙසය.

(20) රූපයෙන් දක්වා ඇත්තේ, එක් අයෙකු කේන්ද්‍ර කරගෙන බොහෝ දෙනාට සංදේශය පැතිර යන විධිමත් සන්නිවේදන අවස්ථාවකි. මෙය හඳුන්වන්නේ,
(1) චක්‍රිය ආකෘතිය
(2) රෝද ආකෘතිය
(3) වයි ආකෘතිය
(4) දාම ආකෘතිය




(21) ලේඛනයක පිටපත් ලබා ගැනීම සඳහා යොදා ගනු ලබන්නේ,
(1) ලේසර් මුද්‍රණ යන්ත්‍රය (2) ඩොට් මුද්‍රණ යන්ත්‍රය
(3) ඡායා පිටපත් යන්ත්‍රය (4) ඉන්ක්ජෙට් මුද්‍රණ යන්ත්‍රය

(22) ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය ආරම්භ වන්නේ,
(1) 1948 වර්ෂයේ දීය. (2) 1924 වර්ෂයේ දීය.
(3) 1832 වර්ෂයේ දීය. (4) 1979 වර්ෂයේ දීය.

(23) විද්‍යුත් තැපැල මගින්,
A - ලෝකයේ කොතැනක සිට හෝ ලිපි ගනුදෙනු කළ හැකිය.
B - වීඩියෝ, චිත්‍රපට හෝ ඡායාරූප ආදිය හෝ හුවමාරු කළ හැකිය.
C - යවන හා ලැබෙන ලිපිවල පිටපත් තැන්පත් කරගත හැකිය.
D - කෙටි කාලයක් තුළ ලෝකයේ ඕනෑම තැනකට යැවිය හැකිය.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A, B හා C පමණක් නිවැරදිය. (2) B, C හා D පමණක් නිවැරදිය.
(3) A, C හා D පමණක් නිවැරදිය. (4) A, B, C හා D යන සියල්ලම නිවැරදිය.

(24) ඵලදායී ලේඛනයක ලක්ෂණයකි.
(1) සම්මත නොවන ව්‍යාකරණ විධි භාවිතය (2) නිරවුල් හා අපහැදිලි බව
(3) ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලි බව (4) වචන ලංකර ලිවීම.


(25) අ.පො.ස. සා/පෙළ සම්මන්ත්‍රණයක් සඳහා සහභාගි වන සිසුන් 250ක පමණ පිරිස වෙත පිටු 2කින් සමන්විත නිබන්ධනයක් ලබාදීමට වඩාත් උචිත මුද්‍රණ ක්‍රමය වන්නේ,
(1) ඕෆ්සෙට් මුද්‍රණයයි. (2) තිර පිටපත් ක්‍රමයයි.
(3) අංකිත අනුපිටපත්කරණයයි. (4) පරිගණක මුද්‍රණ ක්‍රමයයි.

(26) රූප සටහන මගින් සිදු කරන සන්නිවේදනය
(1) වාචික හා නිර්වාචික වේ.
(2) ලිඛිත හා වාචික වේ.
(3) දෘශ්‍ය හා ලිඛිත වේ.
(4) වාචික, නිර්වාචික, ලිඛිත හා දෘෂ්‍ය වේ.




(27) හැරල්ඩ් ලැස්වෙල් ඉදිරිපත් කරන සන්නිවේදනය පිළිබඳ අර්ථ කථනයේ සඳහන් වන සන්නිවේදන මූලිකාංග ගණන වනුයේ,
(1) 5කි. (2) 4කි. (3) 6කි. (4) 7කි.

(28) සන්නිවේදන වර්ගීකරණය සිදු කරනු ලබන්නේ,
(1) කාලානුරූපීවය. (2) පුද්ගල අවශ්‍යතාව අනුවය.
(3) තාක්ෂණික උපකරණ භාවිතය අනුවය. (4) පුද්ගල සංඛ්‍යාව අනුවය.

(29)


ඉහත දක්වා ඇති අවිධිමත් සන්නිවේදන ආකෘතිවල පිළිවෙළ වන්නේ,
(1) ඕපාදූප දාමය, පර්ෂද දාමය, තනි දාමය, සම්භාවිතා දාමය
(2) සම්භාවිතා දාමය, පර්ෂද දාමය, ඕපාදූප දාමය, තනි දාමය
(3) සම්භාවිතා දාමය, තනිදාමය, ඕපාදූප දාමය, පර්ෂද දාමය
(4) ඕපාදූප දාමය, තනිදාමය, පර්ෂද දාමය, සම්භාවිතා දාමය

(30) ජොහැන්නස් ගුටෙන්බර්ග්, ජෝන් ලොගීබෙයාඩ්, ගුග්ලිමෝ මාකෝනි යන අය අදාල වන, මාධ්‍ය පිළිවෙල වන්නේ,
(1) පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය (2) පුවත්පත, රූපවාහිනිය, ගුවන් විදුලිය
(3) රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත (4) රූපවාහිනිය, පුවත්පත, ගුවන්විදුලිය

(31) ශ්‍රී ලංකාව තුළ ආරම්භ වූ පළමු රූපවාහිනී සේවාව වනුයේ,
(1) ස්වාධීන රූපවාහිනිය (2) ජාතික රූපවාහිනිය
(3) ටී. එන්. එල්. රූපවාහිනිය (4) සිරස රූපවාහිනිය

(32) ද්වි පුද්ගල සන්නිවේදනය අවස්ථාවක් නොවන්නේ,
(1) බසයේ කොන්දොස්තර සමග කතා කිරීම. (2) සම්මන්ත්‍රණයකට සහභාගි වීම.
(3) වෛද්‍යවරයකු හමු වීම. (4) පොලිසියට ගොස් පැමිණිල්ලක් කිරීම.

(33) ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම සිදුවන සන්නිවේදන වර්ගය වන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (2) අන්තර් පුද්ගල සන්නිවේදනය
(3) සමූහ සන්නිවේදනය (4) ජන සන්නිවේදනය

(34) පරිගණක අකුරු සැකසීම, පිටු සැලසුම හා ඡායාරූප සංස්කරණය මූලික අවශ්‍යතාවක් වන්නේ,
(1) ලිතෝ ග්‍රැෆි මුද්‍රණයේ දීය. (2) ලෙටර් ප්‍රෙස් මුද්‍රණයේ දීය.
(3) පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දීය. (4) ස්ක්‍රීන් මුද්‍රණයේ දීය.

(35) නිර්වාචික සන්නිවේදනය පිළිබඳ යහළුවන් කිහිප දෙනෙක් අතර ඇති වූ කතා බහක් පහත දැක්වේ.
A - මුහුණින් හා ඇස්වලින් කරන ප්‍රකාශයන් නිර්වාචික සන්නිවේදනයයි.
B - වචන උච්චාරණය හා හඬ උස් පහත් කිරීමත් අයත් වේ.
C - ඇඳුම හා පෙනුම වඩා වැදගත් වේ.
D - ස්පර්ශය, අතට අත දීම යනාදියත් නිර්වාචික සන්නිවේදනයයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිර්වාචික සන්නිවේදනය හා ගැළපෙන අදහස් ප්‍රකාශ කරන්නේ,
(1) A, B හා C පමණි. (2) B, C හා D පමණි.
(3) A, B හා D පමණි. (4) A, B, C හා D සියල්ලන්මය.

(36) කථිකයා සිය කථනය ආරම්භ කළ යුත්තේ සමූහය සමග ඇස් සම්බන්ධතාව ගොඩනගා ගනිමිනි. මෙය හඳුන්වනු ලබන්නේ,
(1) සබකෝලය (2) ප්‍රදීපාගාර උපක්‍රමය (3) සංජානනය (4) දොරටුපාල සංකල්පය

(37) අකුරු මුද්‍රණය වන්නේ තිත් වශයෙන් එක් වීමෙනි. කළු-සුදු පිටපත් පමණක් ලබාගත හැකිය. මෙම කාර්යය සිදු කරනු ලබන මුද්‍රණ යන්ත්‍රය වන්නේ,
(1) ඉන්ක්ජෙට් මුද්‍රණ යන්ත්‍රය (2) ඩොට් මුද්‍රණ යන්ත්‍රය
(3) ලේසර් මුද්‍රණ යන්ත්‍රය (4) ඡායා පිටපත් යන්ත්‍රය

(38) අන්තර්ජාල පහසුකම් යොදා ගනිමින් යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් හෝ විසින් පවත්වාගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු ඇතුලත් ගොනුව හඳුන්වන්නේ,
(1) ෆැක්ස් යන්ත්‍රය නමිනි. (2) විද්‍යුත් තැපැල නමිනි.
(3) වෙබ් අඩවි නමිනි. (4) පේජරය නමිනි.

(39) www. doenets.lk වෙබ් අඩවිය පවත්වාගෙන යන්නේ,
(1) අධ්‍යාපන අමාත්‍යාංශය (2) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
(3) ජාතික අධ්‍යාපන ආයතනය (4) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

(40) ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා බලපත්‍ර ලබාදීම සිදුවන්නේ,
(1) විදුලි සන්දේශ නියාමන කොමිසන් සභාව මගිනි.
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගිනි.
(3) ජාතික චිත්‍රපට සංස්ථාව මගිනි.
(4) රැගුම් පාලක මණ්ඩලය මගිනි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

87 | S | II

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** **කාලය : පැ. 02යි.**

වැදගත් :

✳ පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

## I කොටස

(01) පසුගිය දා තරුපිරි මහා විද්‍යාලයේ පාසල් මාධ්‍ය දින වැඩමුළුව සඳහා ආරාධිත දේශනය පවත්වන ලද්දේ ප්‍රවීන ගුවන් විදුලි නිවේදක චතුර ගජසිංහ මහතා විසිනි. ඔහු ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමාන නව මාධ්‍ය දක්වාම සන්නිවේදනයේ විකාශනය පිළිබඳ හරවත් කතා බහක නිරත වූයේ සහභාගි වූවන්ගෙන් ප්‍රශ්න අසමින් හා පිළිතුරු ලබා ගනිමිනි.

(i) ප්‍රාග් ඓතිහාසික යුගයේ සිතුවම් දක්නට ලැබෙන ප්‍රසිද්ධ ස්ථාන දෙකක් නම් කරන්න.

(ii) කඩදාසිය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(iii) අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගත හැකි තාක්ෂණික මෙවලම් දෙකක් නම් කරන්න.

(iv) නූතන දෘෂ්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න.

(v) විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාර 2ක් සඳහන් කරන්න.

(vi) භාෂාවේ දෘශ්‍ය ස්වරූපය කුමක් ද?


(vii) රූපවාහිනි සේවාවක පවතින විවිධ අංශ අතුරින් දෙකක් නම් කරන්න.

(viii) සංවෘත පරිපථ රූපවාහිනි කැමරා (CCTV) භාවිතයේ වාසි දෙකක් ලියන්න.

(ix) අන්තර් ජාලයේ ජනප්‍රිය සෙවුම් යන්ත්‍ර දෙකක් නම් කරන්න.

(x) සමාජ මාධ්‍ය ජාල දෙකක් නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

(02)




(i) ඉහත ආකෘතිය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 01)

(ii) ඉහත ආකෘතියේ A, B, C සහ D නම් කරන්න. (ලකුණු 02)

(iii) සන්නිවේදන බාධක වර්ග දෙක නම් කර හඳුන්වන්න. (ලකුණු 03)

(iv) ජනසන්නිවේදනය ලක්ෂණ හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස, වර්තමානය වන විට බොහෝ කාර්යාලයීය කාර්යයන්, පහසුවෙන් කර ගැනීමට අවස්ථාව උදා වී ඇත.

(i) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ ප්‍රධාන පියවර හතරකි. එහි මුල් පියවර දෙක සඳහන් කරන්න. (ලකුණු 01)

(ii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ (DTP) වාසි දෙකක් නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(iii) කාර්යාලීය මාධ්‍ය උපකරණ තුනක් විස්තර කරන්න. (ලකුණු 03)

(iv) දුරකථන භාවිතයේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(04) පන්ති කාමරයක් යනු සමූහ සන්නිවේදනය ක්‍රියාත්මක වන ස්ථානයකි.

(i) ප්‍රක්ෂේපණය වන පන්ති කාමර මාධ්‍ය උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 01)

(ii) කළුලෑල්ල පරිහරණයේ දී සැලකිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) විද්‍යුත් තැපෑල භාවිතයේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)

(05) රටක ක්‍රියාත්මක වන ජනමාධ්‍ය ආයතන රාශියකි.

(i) ශ්‍රී ලංකාවේ, පළමු වන සිංහල මාධ්‍ය, පුවත්පත නම් කරන්න. (ලකුණු 01)

(ii) මාධ්‍ය ආයතනයකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයන් දෙකොටසකි. නම් කරන්න. (ලකුණු 02)

(iii) ගුවන්විදුලි ආයතනයක දක්නට ලැබෙන අංශ තුනක් නම් කර, කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iv) වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(06) මානවයාට අන්‍යයන් සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා විවිධ සන්නිවේදන ස්වරූප බිහි වී ඇත.

(i) භාෂාවේ මූලික කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) සන්නිවේදන ස්වරූප හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) නිර්වාචික සන්නිවේදන විධික්‍රම තුනක් නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(iv) විධිමත් සන්නිවේදන ආකෘති හතර ඇඳ නම් කරන්න. (ලකුණු 04)

(07) මානව සමාජය සංවර්ධනය වන විට එහි කාර්යයන් පුළුල් විය.

(i) ද්වි පුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01)

(ii) සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) සන්නිවේදනයේ දී අභිසාරිතාව යනුවෙන් කුමක් අදහස් කරන්නේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) හැරල්ඩ් ඩී ලැස්වෙල් ඉදිරිපත් කළ සන්නිවේදන නිර්වචනයෙහි මූලික අංග හතරක් නම් කර විස්තර කරන්න. (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

87 S I,II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 4 | 11. 3 | 21. 3 | 31. 1 |
| 02. 1 | 12. 4 | 22. 2 | 32. 2 |
| 03. 2 | 13. 3 | 23. 4 | 33. 1 |
| 04. 4 | 14. 4 | 24. 3 | 34. 3 |
| 05. 2 | 15. 2 | 25. 3 | 35. 4 |
| 06. 2 | 16. 1 | 26. 4 | 36. 2 |
| 07. 3 | 17. 1 | 27. 1 | 37. 2 |
| 08. 3 | 18. 4 | 28. 4 | 38. 3 |
| 09. 1 | 19. 2 | 29. 3 | 39. 2 |
| 10. 2 | 20. 2 | 30. 2 | 40. 1 |

(ලකුණු 1x40 = 40)

## II පත්‍රය

(01) (i) ප්‍රංශයේ ලැස්කෝ, ස්පාඤ්ඤයේ අල්ටමීරා

(ii) චීන ජාතික සායිලුන්

(iii) ● තැපැල් ලිපි ● ෆැක්ස් පණිවුඩ
- ● දුරකථන ● විද්‍යුත් තැපෑල
- ● අන්තර්ජාල දුරකථන
- ● සමාජ ජාලා වැනි නව මාධ්‍ය

(iv) ● අත් පත්‍රිකා ● පෝස්ටර් ● පොත් පිංච
- ● බිත්ති සටහන් ● ධාරා සටහන් ● මාර්ග සංඥා

(v) ● ඉහළ සිට පහළට සන්නිවේදනය
- ● පහළ සිට ඉහළට සන්නිවේදනය
- ● හරස් සන්නිවේදනය

(vi) ● ලේඛනය

(vii) ● ප්‍රවෘත්ති අංශය, වැඩසටහන් අංශය, දැන්වීම් අංශය

(viii) ● සොර සතුරන්, මංකොල්ලකරුවන් හඳුනා ගැනීම.
- ● සමාජයේ සිදුවන අකටයුතුකම් හෙළි කර ගැනීමට
- ● මහා මාර්ගවල සිදුවන අනතුරු හෙළි කරගැනීම
- ● සේවා ස්ථාන ආදියෙහි කටයුතු පිළිබඳ මනා අධ්‍යයනයට

..............................................

(ix) ● යාහු YAHOO, ගූගල් GOOGLE

(x) ● Face book, twitter, Linked in

..............................................

(2 x 10 = 20)

(02) (i) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් (ලකුණු 01)

(ii) A - සම්ප්‍රේෂකයා B - ඝෝෂා
C - ග්‍රාහකයා D - අග්‍රස්ථානය (ලකුණු 02)

(iii) අර්ථ බාධක
මාධ්‍ය බාධක - නම් කිරීමට ලකුණු 01
විස්තර කිරීමට ලකුණු 1 බැගින් (ලකුණු 03)

(iv) ● සන්දේශය පොදු වූවකි.
- ● සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
- ● සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ.
- ● වෘත්තීය සන්නිවේදකයින් කටයුතු කරයි.
- ● තාක්ෂණික උපකරණ භාවිතා කරයි.

........................................ (ලකුණු 04)

(03) (i) අත් පිටපත සැකසීම
අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම.
(ලකුණු 01)

(ii) අඩු පිරිවැය, ආකර්ශනීය නිමාව, ඉක්මන් බව, පහසුව, කාර්යක්ෂමතාව (ලකුණු 02)

(iii) දින මුද්‍රා යන්ත්‍රය, පරිගණකය, නිල මුද්‍රාව, මුදල් සටහන් යන්ත්‍රය, ගණක යන්ත්‍රය, තැපැල් මුද්‍රා යන්ත්‍රය, මුදල් ගණින යන්ත්‍රය (ලකුණු 03)

(iv) ● දුරකථන ඇමතුම ලබන්නා, ඔබ නම් ඇමතුම සක්‍රීය වූ විගස තමන්ගේ අනන්‍යතාව හෙළි කළ යුතුය.
- ● දෙපාර්ශවයේ ම ගෞරවය රැකෙන පරිදි වචන භාවිතා කළ යුතුය.

- කිය යුතු දේ කෙටියෙන් කීම වඩාත් යෝග්‍ය වේ.
- තමන් නොදන්නා අත හැරුණු ඇමතුම්වලට ඇමතීමෙන් වළකින්න.
- තමන් නොදන්නා අයගේ කෙටි පණිවුඩවලට පිළිතුරු දීමෙන් වළකින්න.

............................................... (ලකුණු 04)

(04) (i)
- ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- අන්තර් ක්‍රියාකාරී පුවරුව (ලකුණු 01)

(ii)
- ලෑල්ල සමස්ත පන්තියට ම දර්ශනය විය යුතුය.
- ලිවීමේ දී ලියන දේ ආවරණය කරගෙන නොලිවිය යුතුය.
- ලෑල්ල වමේ සිට දකුණ දෙසට ලිවීම කළ යුතුය.
- වචන හා පේළි අතර වැඩි පරතරයක් තැබිය යුතුය.
- ලියන දේ පන්තියේ පසු පස පේළියට ද හොඳින් දර්ශනය වන පරිදි ලිවිය යුතුය.

.......................................... (ලකුණු 02)

(iii)
- ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය පහසු කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයෙහි ඵලදායිත්වය ඉහළ නැංවීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් උද්යෝගිමත් හා ආකාර්ශණීය බවට පත් කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරය ප්‍රිය ජනක බවට පත් වීම.
- තොරතුරු ග්‍රහණය කර ගැනීමට, තේරුම් ගැනීමට, මතයේ රඳවා ගැනීමට ග්‍රාහකයන්ට පහසු වීම. (ලකුණු 03)

(iv)
- කාර්යක්ෂම බව ● සුරක්ෂිත බව
- ලිපි පමණක් නොව වීඩියෝ, චිත්‍රපට හෝ ඡායාරූප ආදිය හුවමාරු කරගත හැකි වීම.
- අඩු පිරිවැය

...................................... (ලකුණු 04)

(05) (i) ලංකාලෝකය (ලකුණු 01)

(ii) මාණ්ඩලික මාධ්‍යවේදීන්
ප්‍රාදේශීය මාධ්‍යවේදීන් (ලකුණු 02)

(iii) ප්‍රවෘත්ති අංශය
වැඩසටහන් අංශය
දැන්වීම් අංශය (ලකුණු 03)

(iv)
- කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීම.
- කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම.
- කාර්යාලයේ තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කර ගත හැකිවීම.
- කාර්යාලයේ කටයුතු වඩාත් විධිමත් හා පිළිවෙලකට කළ හැකිවීම.
- කාර්යාලයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකි වීම. (ලකුණු 04)


(06) (i)
- සිතීම විධිමත් කිරීම ● වාචික ප්‍රකාශනය
- සැබෑම හඳුනා ගැනීම ● කාලය සන්නිවේදනය
- දැනුම සංරක්ෂණය
- පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙනයාම

(ලකුණු 01)

(ii)
- වාචික සන්නිවේදනය
- අවාචික සන්නිවේදනය
- ශ්‍රව්‍ය සන්නිවේදනය
- දෘෂ්‍ය සන්නිවේදනය
- ලිඛිත සන්නිවේදනය (ලකුණු 02)

(iii)
- ශාරීරික ඉඟි හා ඉරියව්
- මුහුණේ ඉඟි හා ඉරියව්
- ඇස්වල හැසිරීම
- හඬ, උච්චාරණය හා නිහඬ බව
- ඇඳුම් හා පැළඳුම්
- ස්පර්ශය
- ගන්ධය (ලකුණු 03)

(iv)



චක්‍රීය ආකෘතිය | දාම ආකෘතිය | වයි ආකෘතිය | රෝද ආකෘතිය

(ලකුණු 04)

(07) (i)
- ආදරය කරුණාව හුවමාරු කර ගැනීමට
- සමාජශීලී වීමට
- කාර්යයන් නිම කර ගැනීමට
- අදහස් හා තොරතුරු හුවමාරු කර ගැනීමට
- ඉගැන්වීමට හා ඉගෙන ගැනීමට

......................................... (ලකුණු 01)

(ii)
- තොරතුරු සැපයීම ● සමාජානුයෝජනය
- අධ්‍යාපනය ලබාදීම ● සංවාද හා සාකච්ඡා
- විනෝදාස්වාදය ලබා දීම
- පෙළඹ වීම. (ලකුණු 02)

(iii) මෙහි දී ප්‍රමුඛවන්නේ අන්තර්ජාලයයි, අන්තර්ජාලය මගින් පුවත්පත් කියවන්නට, ගුවන් විදුලියට සවන් දෙන්නට, රූපවාහිනිය නරඹන්නට, සිනමාපට නරඹන්නට මෙන්ම පොත් කියවන්නට හා දුරකථනයෙන් කතා කරන්නට ද හැකිය. මෙහිදී සිදු වී ඇත්තේ සියලු මාධ්‍ය එක්වීමකි.

(ලකුණු 03)

(iv)
- සන්නිවේදකයා ● සංදේශය ● මාධ්‍යය
- ග්‍රාහකයා ● බලපෑම (ලකුණු 04)